**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**தொடர் தொலைக் கல்விநிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்**
**CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA**

සාමාන්‍ය කලා උපාධි පරීක්ෂණය (බාහිර - පැරණි නිර්දේශය) - ඔක්තෝබර් 2019

## ආර්ථික විද්‍යාව II
## ECG 2: සංසන්දනාත්මක ආර්ථික සංවර්ධනය

උපදෙස් :

- ඕනෑම ප්‍රශ්න පහකට **(05)** පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08).
- එක් එක් ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය දක්වා ඇත.
- කාලය පැය තුනයි **(03).**

---

1. i. නවීන ආර්ථික වර්ධනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 05)

   ii. වැඩවසම් ක්‍රමය අභාවයටයාම බටහිර යුරෝපයේ නවීන ආර්ථික වර්ධනය සඳහා පූර්ව කොන්දේසි සපයන ලද බවට සලකන්නේ ඇයි? (ලකුණු 15)

2. දහ අටවන ශතවර්ෂයේ හා දහනවවන ශතවර්ෂයේ මහා බ්‍රිතාන්‍ය කාර්මීකරණ ක්‍රියාවලිය සඳහා කෘෂිකාර්මික විප්ලවයේ දායකත්වය සාකච්ඡා කර අගයන්න.

   (ලකුණු 20)

3. i. දහ අටවන ශතවර්ෂයේ අගභාගයේ සිට මහා බ්‍රිතාන්‍ය කාර්මික අංශයේ ඇතිවූ සංවර්ධන ක්‍රියාවලිය විස්තර කිරීමට 'කාර්මික විප්ලවය' යන යෙදුම කොතරම් ගැළපේද? (ලකුණු 10)

   ii. මහා බ්‍රිතාන්‍ය කාර්මික පරිවර්තනය තුළ එරට කපු පිළි කර්මාන්තය ආශ්‍රිත තාක්ෂණික සොයාගැනීම්වල කාර්යභාරය හා වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

4. දහ නවවන ශතවර්ෂයේ මහා බ්‍රිතාන්‍යයේ හා ප්‍රංශයේ කෘෂිකාර්මික අංශයන්හී සමානතා / අසමානතා විශ්ලේෂණය කරන්න.

   (ලකුණු 20)

5. i. ජර්මානු සොල්වරීනයේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06)

   ii. දහ නවවන ශතවර්ෂයේ අභ්‍යන්තර වෙළෙඳාමේ ව්‍යාප්තිය මඟින් ජර්මනියේ ආර්ථික සංවර්ධනය සඳහා සොල්වරීනයේ ප්‍රධාන දායකත්වයන් සාකච්ඡා කරන්න. (ලකුණු 14)

6. මහා බ්‍රිතාන්‍යයේ හෝ ජර්මනියේ නවීන ප්‍රවාහන ක්‍රමයක් නිර්මාණය කිරීමේ සමාජ හා ආර්ථික වැදගත්කම තක්සේරු කරන්න. (ලකුණු 20)

7 ජර්මනිය හා ප්‍රංශය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් දහ නවවන ශතවර්ෂයේ යුරෝපා රටවල ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ රජයේ කාර්යභාරය විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 20)

8. මහා බ්‍රිතාන්‍ය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් ඕනෑම හතරකට **(04)** කෙටි සටහන් ලියන්න

i. යුධ කොමියුනිස්ට්වාදය
ii. සෝවියට් රුසියාවේ 'නව ආර්ථික ප්‍රතිපත්ති'
iii. වානිජවාදය
iv. දෙවන ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරය
v. 1815 ධාන්‍ය නීති

(එක් කොටසකට ලකුණු 05බැගින්)